# ජාත්‍යන්තර කාන්තා දිනය

**මා**ර්තු **8** වෙනි දින එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රමුඛ ලොව විවිධ ආයතනද, ඒ ඒ රටවල වෙසෙන සියළු කාන්තාවෝද කාන්තා දිනය සමරති. කාන්තාවක වීම නිසා අහිමිවී ඇති අයිතිවාසිකම් ලබාගැනීමටද, ජනසමාජය තුළ කාන්තාවකගේ තත්වය නගාසිටුවා ගැනීමටද, මුහුණපාන අනේක විධ ගැටළු පිළිබඳව ලෝක අවධානය යොමුකරවා ගැනීමටද මෙම දිනයේ වැඩසටහන් උපයෝගීකර ගනිති. රුසියාව, චීනය, යුගෝස්ලෝවියා, බල්ගේරියාව හා වියට්නාමය වැනි රටවලද මාර්තු 8 කාන්තාවන් සඳහා රජයේ නිවාඩු දිනයක් ලෙස ද සැලකේ.

ලොව ජන ගහනයෙන් හරි අඩක්ම පාහේ කාන්තාවෝ වෙති. ලෝක ශ්‍රම බලකායෙන් 42% ක් ම කාන්තාවන් ය. ශ්‍රීලංකාවට ලැබෙන විදේශ විනිමයෙන් 68% ක්ම සපයා දෙන්නේ කාන්තාවන්ය.



ලොව ප්‍රථම අගමැතිවරිය අපේය



***ලෝක ශ්‍රම බලකායෙන් 42% ක්ම කාන්තාවෝ වෙති. ශ්‍රීලංකාවට ලැබෙන විදේශ විනිමයෙන් 68% ක්ම සපයා දෙන්නේ අපේ කාන්තාවන්ය.***

***ලොව ඇරඹුණු දා පටන් කාන්තාව සමාජය තුළ බිරිඳක, මවක, සොහොයුරියක, දියණියක ලෙස ඉටුකරන සේවය මිළ කළ නොහැක.***

***තවද ඔවුන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනයට විශාල වශයෙන් දායකත්වය සපයයි. ඒ සියල්ලට ඇය නිසැක ගෞරවය ලැබිය යුතුය.***




මිනිස් පරපුර බිහිකිරීම, පෝෂණය කොට ඇති දැඩිකිරීම, රැකබලාගැනීම ඉටුවන්නේ කාන්තාවන් වෙතිනි. පෙර අපර දිග ඕනෑම පවුල් ඒකකයක ආහාර සැකසීම, ගෙදර දොර වැඩ, දරු රැකවරණය සැලසීම කාන්තාවටම උරුම වී ඇත්තා සේ ය. උත්තරීතර මව්පදවිය ලද හැක්කේ කාන්තාවකට පමණි. එහෙත් ඈත අතීතයේ සිට අද දක්වාම කිසියම් අසාධාරණ මාලාවක් කාන්තාව වටා ගෙතී ඇත.

කාන්තා විමුක්තිය උදෙසා පැවති මුල්ම ව්‍යාපාරය ගැන වාර්තාවන්නේ බෞද්ධ ඉතිහාසයේය. බුදුන් දවස කාන්තාවන්ට පැවිදි වීමේ අවසරය ඉල්ලා මහා ප්‍රජාපතීගෝතමීය ගේ ප්‍රධානත්වයෙන් කාන්තාවෝ ඉල්ලීමක් කළෝය. දැඩි අකමැත්තෙන් වුව ද බුදුන් වහන්සේ කාන්තාවන්ට පැවිදිවීමේ අවසරය ලබාදුන්න ද, ඒ සඳහා දැඩි නීති රීති වලට යටත්වීමට සිදුවිය. මෙම කැප අකැප කාරණය අනුව පැවිදිවීමට පිරිමින්ට තරම් පහසු මගක් කාන්තාවන්ට නැත. ඉස්ලාම් ආගමට අනුව නබි නායකතුමා ආගම ඇදහීමේ ක්‍රියාව පමණක් නොව මුස්ලිම් සමාජය තුළ කාන්තාවට අඩු සැලකිල්ලක් දැක්විය. ඒවා තරමක් හෝ ලිහිල් වූයේ නබිතුමාගේ දියණිය වූ පාතිමාතුමියගේ ඉල්ලීම නිසාය. ඒ වසර දහස් ගණනකට පෙරය. මෑත අතීතයද එබඳුය.

1857 දී නිව්යෝර්ක් නුවර ඇඟලුම් කම්හලක සේවය කළ ස්ත්‍රීන්ට හා පිරිමින්ට එක සමාන වැඩ කොටසක් නියම කළ අතර වැටුප් ගෙවීමේදී පිරිමින්ට වඩා අඩුවෙන් ස්ත්‍රීන්ට ගෙවීමට නියම විය. මේ ගැන නොසන්සුන් වූ ස්ත්‍රීහු 1857 මාර්තු 8 වෙනි දින වැඩ වර්ජනයක් දියත් කළහ. පාලකයෝ එය නිර්දය ලෙස කඩාකප්පල් කළ අතර, අශ්වයන් යොදා පිරිසට පහර දුන්හ. මෙම සිද්ධිය ඇමරිකාවේ පමණක් නොව යාබද කැනඩාවේත්, මහා බ්‍රිතාන්‍යය, ජර්මණිය, රුසියාව වැනි රටවලත් විශාල අර්බුද ඇතිකරවී ය. එම නිසාම විවිධ කාන්තා සංවිධාන බිහිවීය.

1859 දී කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර ප්‍රථම කාන්තා සංවිධානය කාන්තා ආයතනය **Women Institute** නමින් බිහිවිය. අදටත් මහා බ්‍රිතාන්‍යය තුළ වඩාත් ප්‍රචලිත කාන්තා සංවිධානය මෙයයි.

1908 දී විවිධ රටවලින් පැමිණි කාන්තාවෝ නිව්යෝර්ක් නුවරට රැස්ව තම ඉල්ලීම් ඉල්ලා පෙලපාලියක් පැවැත්වූහ. 1909 දී ඇමරිකාවේ සමාජවාදී පක්ෂය කාන්තා සංවිධානයක් ඇතිකරලීය. 1910 දී ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නුවරට එක්රැස්වූ

***ශ්‍රී ලංකාවේ නීති පනත් කීපයක ඇති විශමතා නිසා කාන්තාවට බලවත් අසාධාරණයක් වී ඇත. උඩරට නීතියේ දේපල සම්බන්ධව ගැහැණු දරුවාට වඩා පිරිමි දරුවාට ඇති අයිතිය වැඩි ය.***

කාන්තාවෝ ලොව පුරා විවිධ රටවල පාලකයන්ගේ අවධානය ලබාගැනීමට සැලසුම් කළහ. මෙහිදී ජර්මණියේ සමාජවාදී ජනතා පක්ෂයේ කාන්තා ප්‍රධානී ක්ලේයා සෙට්කින් (Clare Zetkin) මහත්මියගේ යෝජනාවක් පරිදි ජාත්‍යන්තර කාන්තා දිනය සෑම වසරකම මාර්තු 8 වෙනිදා පැවැත්වීමට තීරණය වුණි. මෙම සමුළුව අවසන්ව දින කීපයකට පසු නිව්යෝර්ක් නුවර වූ අවාසනාවන්ත සිදුවීමක් නිසා නැවතත් කාන්තාවන් පිළිබඳව ලෝක අවධානය යොමුවිය. එනම් 1910 මාර්තු 25 වන දින නිව්යෝර්ක්හි ඇඟලුම් කම්හලක ඇතිවූ ගින්නක් නිසා වැඩකරන කාන්තාවන් 120 ක් මරණයට පත්වීමයි. ගින්නට මැදිවූ පිරිමින් ගොඩනැගිල්ලෙන් පිටතට පැනීමෙන් හා පිටතට වහා දිවීමෙන් බේරුණු අතර කාන්තාවන්ට එසේ දිව්ගලවා ගන්නට නොහැකි විය.

1911 මාර්තු 8 දින වන විට ලොව බොහෝ රටවල කාන්තා දිනය නිල වශයෙන් පැවැත්විය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1975 දී කාන්තා දිනය නිල වශයෙන් පිළිගනු ලැබූ අතර විවිධ තේමාවන් ඔස්සේ එය ලොව පුරා සැමරීමට මූලික වේ. ලබන වසර වන විට කාන්තා දිනය ආරම්භ කර වසර 100 ක් ගතවේ.

තොටිල්ල පදවන අත ලොව ආණ්ඩුකරයි යන කියමන සැබෑවක් කරමින් 1960 ජූලි මස 20 වන දින ලොව ප්‍රථම කාන්තා අග්‍රාමාත්‍ය ධූරයට සිරිමාවෝ බන්ඩාරනායක මැතිනිය පත්වූවාය. ඊට පෙර ශ්‍රීලංකාවේද, වෙනත් රටවලද රැජිණන් විසින් රාජ්‍ය පාලනය මෙහෙයවනු ලැබ ඇති නමුදු ඒවා බොහෝවිට සිදුවූයේ පරම්පරාගත රාජ්‍ය ධූරාවලිය අනුව සම්ප්‍රදායානුකූල පාලන ලෙසිනි.

සිරිමාවෝ මැතිනිය නිසා ලොව කාන්තාවකට ඕනෑම වගකීමක් දැරීමට හැකි බව ඔප්පුවිය. ශ්‍රීලංකාවට මේදවසේත් ජාත්‍යන්තරව තිබෙන පිළිගැනීමේ සාධකය ඇයයි. අද වනවිට ලෝකයේ කාන්තාවෝ බොහෝ ඉල්ලීම් දිනාගනිමින් ඉදිරියට පැමිණ ඇත. එහෙත් දේශපාලනයේ යෙදෙන කාන්තාවන්ගේ අඩුවක් ලොවපුරා දක්නට ලැබේ. මාග්‍රට් තැචර්, ගෝල්ඩා මේයර්, ඉන්දිරා ගාන්ධි, සිරිමාවෝ බණ්ඩාරනායක, බෙනසීර් භුතෝ වැන්නන් ඉටු කළ කාර්‍යභාරයට නවක මුහුණු එකතුවී නොමැත. සෞදි අරාබියාව වැනි මුස්ලිම් රටවල කාන්තාවන්ට ඡන්දය දීමේ අයිතිය වත් නැත. දේශපාලනයේ කාන්තා නියෝජනය ශ්‍රීලංකාවේ 5% ක් වන අතර බ්‍රිතාන්‍යයේ එය 26% කි. ඉන්දියාව, පකිස්ථානය වැනි රටවල කාන්තාවන්ට අනිවාර්ය ප්‍රතිශතයක් වෙන්කර තිබේ. ශ්‍රීලංකාවේ කාන් තාවෝ මැතිවරණ නාමයෝජනාවලදී 25% ක් වැනි අපේක්ෂක ප්‍රතිශතයක් ඉල්ලා සිටිති.

1931 දී ක්‍රියාත්මක වූ ඩොනමෝර් කොමිසමේ මූලික යෝජනාවල කාන්තාවන්ට ඡන්දය දීමේ අයිතිය නැතිකර තිබුණි. එහෙත් ඩේසි බණ්ඩාරනායක (බණ්ඩාරනායක මහතාගේ මව) ඇග්නස් සිල්වා යන මහත්මීන්ගේ මූලිකත්වයෙන් කාන්තාවන් පිරිසක් මෙහෙයවූ දැඩි ඉල්ලීම් මාලාවක් නිසා 1931 දී ශ්‍රීලංකා කාන්තාවන්ට ඡන්දය දීමේ අයිතිය ලැබිණ. එම ඉල්ලීම් කළ කාන්තාවෝ පසු කලෙක ලංකා මහිලා සමිතිය නමින් සංවිධානයක් පිහිටුවා ගත්හ. එය අදටත් ශ්‍රීලංකාවේ ක්‍රියාත්මක වෙයි.

අප රට ශ්‍රීලංකාවේ අද වැඩ බලන අග්‍රවිනිශ්චයකාර තනතුර හොබවන්නේ ද කාන්තාවකි.

ශ්‍රීලංකාවේ නීති පනත් කීපයක ඇති අපූරු විශමතා කීපයක් නිසා කාන්තාවට බලවත් අසාධාරණයක් වී ඇත. උඩරට නීතියේ මුදල් හා දේපල සම්බන්ධව ගැහැණු දරුවාට වඩා පිරිමි දරුවාට ඇති අයිතිය වැඩිය. තවද ශ්‍රීලංකාවේ කාන්තාවක් විදේශිකයෙකු හා විවාහ වුවහොත් ඇයට ශ්‍රීලංකාවේ පුරවැසි හිමිකම අහෝසි වන අතර, යම් හෙයකින් විදේශික කාන්තාවක් ශ්‍රීලංකාවේ පිරිමියෙකු හා විවාහ වුවහොත් ඒ විදේශීය කාන්තාවට සියළු පුරවැසිකම් හිමිවේ.

මහනුවර දළදා මාළිගාවේ දියවඩන නිළමේ තනතුරට පත්වන්නේ ඒ ඒ නාහිමිවරුන්ද, දේවාලවල නිළමේවරුන්ද, මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ ද ඡන්දයෙනි. එහෙත් විහාරගම් දේවාල පනත යටතේ යම් හෙයකින් කාන්තාවක් ප්‍රාදේශීය ලේකම් වේනම් ඇයට දියවඩන නිළමේ තේරීමේ ඡන්දයට හිමිකම් නැත.

ශ්‍රීලංකාවේ පළාත්පාලන අයතනවලට නාමයෝජනා දීමේදී 40% ක් තරුණ කොටස් වලට වෙන් කළ යුතුය. හිටපු වනිතා කටයුතු පිළිබඳ ඇමතිවරියක වූ අමරා පියසීලි රත්නායක කියා සිටියේ මෙම 40% න් බාගයක් වත් තරුණියන්ට වෙන් කරන ලෙසය. එහෙත් එයද තවම ඉටුවී නොමැත.

1998 ජාත්‍යන්තර කාන්තා දිනයට කාන්තාවෝ 3000 ක් පමණ අරලියගහ මැදුරට රැස්වූහ. කාන්තාවට සමාජය කෙරෙහි කළහැකි බලපෑම කුමක්දැයි එක් මාධ්‍යවේදියෙක් එවකට වනිතා කටයුතු පිළිබඳ ඇමතිනියව සිටි හේමා රත්නායකගෙන් ප්‍රශ්න කළේය. ඇමතිවරිය ඊට එක එල්ලේම දුන් පිළිතුර මෙයයි.

"අද කාන්තාවො 3000 ක් පමණ මෙතනට ඇවිත් ඉන්නවා........ මේ අයගේ ගෙවල් වල අද දවල්ට කෑම උයන්න කෙනෙක් නෑ........ ඒ නිසා ස්වාමි පුරුෂයන්ට කෑම නැහැ........ දරුවන්ට කෑම නැහැ........ මේ රැස්වීම ඉවරවෙලා කලින් ගෙදර යන්න බැරි වුනොත් හැන්දෑවට තේත් නෑ........ සමහර විට රැටත් කෑමක් නැති වේවි........" යනුවෙනි.

මහා බ්‍රිතාන්‍යයේ ද කාන්තා අයිතීන් ඉල්ලා බොහෝ අරගල සිදුව ඇත. 1928 තෙක්ම බ්‍රිතාන්‍ය කාන්තාවන්ට ඡන්ද අයිතිය නොලැබුණි. අදටත් සමහර ක්‍රීඩා සමාජවල සහ ප්‍රභූ සංවිධාන වල සාමාජිකත්වය කාන්තාවන්ට ලබාගත නොහැක. 1913 දී ඇමලි ඩේවිසන් නමැති කාන්තාව සුප්‍රකට ඇස්කොට් අශ්ව ශූරතා තරඟය දුවන අවස්ථාවේ දී එහි ධාවනය කළ ජෝර්ජ් මහරජුගේ අශ්වයා ඉදිරියට පැන කාන්තා අයිතිය ඉල්ලා හඬනැගීය. සති කීපයකට පසු ඇය මියගියද කාන්තා අයිතීන් කීපයක් ලබාදීමට රජු එකඟ වූයේ ය.

කාන්තාවට මුහුණදීමට සිදුව ඇති ප්‍රධානතම සමාජ ගැටළුව වී ඇත්තේ ලිංගික අතවරය. ලිංගික අතවර කරන අයට දැඩි දඬුවම් ලබාදීමට ලොව සියළුම රටවල් පාහේ ක්‍රියාකරති. අද ලොව සෑම තැනම දේශපාලන ක්ෂෙත්‍රය ප්‍රචණ්ඩත්වයට බරය. මේ නිසාම කාන්තාව දේශපාලනයට එළඹීමේ අවස්ථා අඩුව ඇත. දේශපාලනයේ නියැළි කාන්තාවන් වැඩිදෙනකු ඇත්තේ ස්වීඩනයේය. ප්‍රතිශතය 40% කි. ලොව වඩාත් පිරිසිදු හා ක්‍රමානුකූල දේශපාලනය ඇත්තේ ස්වීඩනයේ බව විචාරකයින්ගේ මතයයි.

බොහෝ වාණිජ බැංකු පිරිමින්ට වඩා ගැහැණුන්ට ණය දීමට කැමතිය. එයට හේතුව කාන්තාවන්ට සැබැවින්ම අරපරෙස්සම මෙන්ම ණයතුරුස් ගෙවාදැමීමට ද ඇති පුරුද්දයි.

ශ්‍රීලංකාවේ විහාර මහා දේවිය වැනි එඩිතර කාන්තාවන් ගැනද සටහන්ව ඇත. 1818 ඌව කැරැල්ලේදී කොහුකුඹුරේ රාළ නමින් ප්‍රකට සිංහළ වීරයා බිබිල ප්‍රදේශයේ ගම ගෙදරකට වැදී සැඟවුණේ තමා ලුහුබඳින ඉංග්‍රීසි සෙබළුන්ගෙන් බේරීමටය. එහෙත් සෙබළුන් එම ගමගෙදරට පැමිණ. ගෙදර කාන්තාවගෙන් කොහුකුඹුරේ රාළ ඉන්නා තැන දන්නවාදැයි විමසූවේලු. "ඉන්න තැන දන්නවා... ඒත් තොපිට කියන්නෙ නෑ...." කියමින් ඇය ඉඳුල් වතුර බාල්දියකින් සෙබළුන්ට දමාගසා පිහියක් පෙන්නා උන් පළවා හැරියේලු.

කාන්තාව සමාජය තුළ බිරිඳක, මවක, සොහොයුරියක, දියණියක ලෙස ඉටුකරන සේවය මිළ කළ නොහැක. තවද ඔවුන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනයට විශාල වශයෙන් දායක වේ. ලංකාවේ විදේශ විනිමයෙන් 68% ක් සොයා දෙන්නේ කාන්තාවන් බව මම මුලින් සඳහන් කළෙමි. ඕනෑම පවුල් ඒකකයක සෑමට කලින් නිදි යහනෙන් අවදි වී, සෑමට පසු නිදි යහනට යන කාන්තාවගේ සේවයට ගෞරවකළ යුතුය. කාන්තාවගේ ප්‍රතිරූපය නංවාලිය යුතුය.

♦ ***මේජර් වී. බී. කරුණාරත්න***
**Major V. B. Karunaratne**
***Former Deputy Sergeant-At-Arms of Sri Lanka Parliament***
**Oxford UK**

## Let's make Jaffna Library World Renowned Again

**Jaffna Library was once known as the best library in South Asia. Now there is a chance to bring that past glory back to this centre of wisdom.**

**The Librarian of the Jaffna Library, through the Ministry of Foreign Affairs, is requesting the Sri Lankans living in the UK, to provide it with books and monetary assistance to upgrade the library.**

**Well wishers could contact Ms. Anoma at the High Commission of Sri Lanka through 0207 262 1841 (Ext. 239) or e-mail: mail@slhc-london.co.uk to make the donations.**

**Sri Lanka High Commission**
**13 Hyde Park Gardens**
**London W2 2LU**